

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයට එරෙහිව ඇති වූ

# විමුක්ති අරගළ

අජිත් තලවත්ත

NASANA PUBLICATIONS

9302
THA

LIBRARY SYSTEM
LIBRARY RAJARATA UNIVERSITY OF SRI LANKA MIHINTALE
LN

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයට එරෙහිව ඇති වූ

# විමුක්ති අරගල



RAJMNLIB
78777

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 78777 |
| වර්ග අංකය | 955.9302 THA |

අජිත් තලවත්ත

## කර්තෘ සටහන

මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනය තුළින් ගැමි ජනතාවට අත්විඳීමට සිදුවූ පීඩනයට එරෙහිව සිදුකරන ලද අරගල (කැරලි) සම්ප්‍රදාය පාදක කර ගනිමින් සිදුකරන ලද්දකි. මෙතුළින් එම වකවානුවේදී ක්‍රි.ව.1798, 1818 සහ 1848 ගැමි කැරලි සහ එහි ප්‍රතිඵල විමර්ශනයකට ලක් වේ.

ලිබරල්වාදී ඉතිහාසකරණය තුළ කැරලිවල වැදගත්කම එතරම් දුරට ඉස්මතු කර නොමැත. මෙම ක්‍රියාවලිය බිඳ දමමින් පශ්චාත් නූතනවාදී චින්තනය මඟින් කැරලිවල වැදගත්කම හුවාදක්වමින් නව කතිකාවතක් ගොඩ නැගී තිබේ. එම කතිකාව තුළ සිට කැරලි පිළිබඳව නව දෘෂ්ටි කෝණයකින් අවධානය යොමු කිරීමට මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ.

මෙරට ඉතිහාසයේ දේශපාලන, ආර්ථික හා සමාජීය ගමන් මඟ තීරණාත්මක ලෙස නව දිශානතියකට යොමු කිරීමට හැකි වූයේ බ්‍රිතාන්‍ය ජාතිකයන් හටය. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ ආධිපත්‍යය ක්‍රි.ව.1796 දී පිහිටුවීය. ලන්දේසීන් සතුවූ මුහුදුබඩ ප්‍රදේශ, ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගමට හිමිවීමෙන් පසු ක්‍රි.ව.1802 දී බ්‍රිතාන්‍ය කිරීටයේ පාලනය යටතට පත්විය. දැඩි අභියෝග හමුවේ නොයෙක් මතභේදයන් සමග ගැටෙමින් පැවති කන්ද උඩරට රාජ්‍යය ක්‍රි.ව.1818 දී බ්‍රිතාන්‍යයන් විසින් අඈඳා ගැනීම තුළින් සමස්ත දිවයිනේම බලය ඔවුන්ට හිමි විය. එතැන් සිට ඔවුන්ගේ අධිරාජ්‍යවාදී ආධිපත්‍යය ස්ථාපිත වන ලෙස නව ප්‍රතිපත්ති ලංකාව සම්බන්ධයෙන් අනුගමනය කළේය. බ්‍රිතාන්‍යයන් අප්‍රිකානු යටත්විජිත පාලනයේදී ගෝත්‍රිකවාදය භාවිත කළ අයුරින් මෙරටේදී කුල භේදය සහ ජනවාර්ගික පදනම තුළින් අනේකවිධ වරප්‍රසාද හිමිකර දෙමින් ස්වකීය ආධිපත්‍යය ගොඩනගා තිබේ. නොදියුණු මිනිසුන් ශිෂ්ටත්වය කරා ගෙනයෑමේ වගකීම යුරෝපීන් සතුව පවතින බව පෙන්වා, දීර්ඝ කාලයක් ලංකාවේ චිරාගතව පැවති සංස්කෘතිය නොසලකා හැරියේය. එහි ප්‍රතිඵලය වූයේ සමාජයේ අතළොස්සකට පමණක් වරප්‍රසාද හිමිවූ බැවින් සෙසු කොටස් පීඩනයට ලක්වීමයි.

ක්‍රි.ව.1815 න් අනතුරුව බ්‍රිතාන්‍යයන් විසින් උඩරට හා පහතරට සම්බන්ධයෙන් වෙනම පාලන ක්‍රමයක් හඳුන්වා දුන්න ද එහි අහිතකර ප්‍රතිඵල ඇතිවිය. පරිපාලන කටයුතු සිදුවීමේදී ආදායමට වඩා වියදම වැඩිවූ බැවින් ඒ පිළිබඳ සෙවීමට විශේෂ වූ කෝල්බෲක් කැමරන් කොමිසම පිහිටුවන ලදී. එය මෙරට ඉතිහාසයේ දේශපාලන, ආර්ථික, සමාජීය හා සංස්කෘතික පදනම තීරණාත්මක ලෙස නව මාවතකට ප්‍රවේශ කිරීම සඳහා බලපෑවේය. මෙතෙක් පැවති සාම්ප්‍රදායික ආර්ථික රාමුවෙන් මිදී ධනවාදී ආර්ථිකයට ජනතාව හුරුවීමත් සමග සමාජ ක්‍රමය දෙදරා යන්නට විය. නව සමාජ රාමුව තුළ සිරගත වූ ජනතාව ස්වකීය පීඩනය හුවාදැක්වීමට විවිධ

ක්‍රියාමාර්ගයන්හි නිරත විය. විශේෂයෙන්ම ස්වරාජ්‍යය මෙම උද්ඝෝෂණ මඟින් අපේක්ෂා කළේය. 1948 නිදහස ලබා ගන්නා තෙක් ස්වදේශිකයන්ගේ උද්ඝෝෂණ ව්‍යාපාරයන් ක්‍රියාත්මක වූ බව පෙනේ.

සියවස් එක හමාරකට අධික කාලයක් ලංකාවේ පැවති බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලනය තුළින් උද්ගත වූ පීඩනය නිසා කැරලි ඇති විය. ඒවා මර්දනය කර ආධිපත්‍යය පිහිටුවීම පිණිස හිංසාකාරී ක්‍රියාමාර්ග බ්‍රිතාන්‍යයන් විසින් ක්‍රියාත්මක කළහ. නමුත් ඔවුන් එවැනි ක්‍රියාමාර්ග අනුගමනය කළ බවට කිසිදු අවස්ථාවක පෙන්වා නොදේ. නූතනයේ බුද්ධිමය කතිකාව තුළින් සෑම දෙයක්ම ප්‍රශ්න කිරීමකට භාජනය විය. පශ්චාත් නූතනවාදී චින්තනයේ ක්‍රියාකාරීත්වයත් සමග මෙම කැරලිවල වැදගත්කම හුවා දක්වා ලිබරල්වාදී ඉතිහාසකරණය ප්‍රශ්න කිරීමට ලක් කළේය. අධිරාජ්‍යවාදී පාලනයට එරෙහිව ඇතිවූ මෙම අරගල බ්‍රිතාන්‍යයන් එතරම් දුරට ගණන් නොගන්නා බව පෙන්නුවත්, ඇතැම් කැරලි නිසා ඔවුන් හට මෙරටින් යාමට සිදුවූ අවස්ථා ද දක්නට ලැබුණි. ගැමි ජනතාවගේ අපේක්ෂාවන් ඉස්මතු කර දැක්වීමට ද ඔවුන් එතරම් දුරට උත්සාහ නොගත් බව පෙනේ.

මෙම කැරලි පිළිබඳව විවිධ විද්වතුන් පර්යේෂණ සිදුකර ඇතත් ගැමි ජනතාවගේ හඬ ඉස්මතු කර දැක්වීමට එතරම් දුරට උත්සාහ ගෙන නොමැති බව පෙනේ. මෙම අධ්‍යයනයේ පළමු පරිච්ඡේදය මඟින් ලංකාවේ බ්‍රිතාන්‍යයන් විසින් බලය පිහිටුවීම පිළිබඳ විමර්ශනයට භාජනය වේ. දෙවන පරිච්ඡේදය මඟින් විමුක්ති අරගල සම්බන්ධයෙන් පශ්චාත් නූතනවාදී මතවාදය හඳුනා ගැනේ. තෙවන, හතරවන සහ පස්වන පරිච්ඡේද මඟින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයට එරෙහිව මෙරට ග්‍රාමීය ජනතාව ගෙනගිය අරගල (කැරලි) පිළිබඳ පුළුල් ලෙස සාකච්ඡා කෙරේ.

**අජිත් තලවත්ත**

නො.302/2,
ගුරුගම,
මුරුතලාව

# පටුන

1. බ්‍රිතාන්‍ය ජාතිකයන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවීම
- ක්‍රි.ව.1796-1802 කාල පරිච්ඡේදය
- ක්‍රි.ව.1802-1948 කාල පරිච්ඡේදය

2. විමුක්ති අරගල පිළිබඳ නූතන කථිකාව

3. ක්‍රි.ව.1798 විමුක්ති කැරැල්ල
- ඉංග්‍රීසි පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම යටතේ ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය
- ක්‍රි.ව.1797 හි ඇතිවුණු මහජන කැලඹීම් ව්‍යාප්තිය
- ක්‍රි.ව.1798 කැරැල්ලේ ප්‍රතිඵල

4. කන්ද උඩරට රාජධානිය
- ක්‍රි.ව.1815 උඩරට ගිවිසුම
- ශ්‍රී වික්‍රම රාජසිංහයන්ගේ ඉරණම

5. ක්‍රි.ව.1817-1818 කැරැල්ල
- කැරැල්ල ආරම්භ වීමට හේතුවූ පසුබිම
- කැරැල්ලට සිංහලයන්ගේ පෙළගැසීම
- කැරැල්ල මර්දනය කිරීම
- සිංහල නායකයින්ගේ ඉරණම

6. ක්‍රි.ව.1848 කැරැල්ල
- කැරැල්ල ඇතිවීමට පෙර ජනතා නැගීසිටීම
- ක්‍රි.ව.1848 කැරැල්ලට හේතුවූ කරුණු
- කැරැල්ලට ආසන්නතම හේතු
- කැරැල්ල ආරම්භය හා ව්‍යාප්ත වීම
- ක්‍රි.ව.1848 කැරැල්ලේ නායකයෝ
- කැරැල්ලේ ප්‍රතිඵල

7. නිගමනය